PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2019.11.26

අතිගරු ජනාධිපති තුමා,
ජනාධිපති ලේකම් කාර්යාලය,
ගාලු මුවදොර,
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

## අමාත්‍යාංශ ලේකම්වරුන් පත් කිරීම

ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දීමෙන් අනතුරුව මේ දක්වා ඔබතුමන් ගනු ලැබූ බොහොමයක් තීරණ අපගේ පැසසුමට ලක්වේ. ඒ අතර, කැබිනට් මණ්ඩලය අවම කිරීම, අමාත්‍යාංශවල ජනාධිපතිවරයාගේ ඡායාරූපය ප්‍රදර්ශනය අත්හිටුවීම, පරිවාර රථ අඩු කිරීම, කාර්ය මණ්ඩලය සීමා කිරීම, රාජ්‍ය නිලධාරීන්ගේ විදේශ ගමන් අවම කිරීම වැනි තීරණ මහජනයාගේ අතිශය ප්‍රසාදයටත්, ගෞරවයටත් හේතුවන තීරණවේ.

අමාත්‍යාංශ ලේකම්වරුන් සහ ආයතන ප්‍රධානීන් තෝරා පත්කිරීම සඳහා කමිටුවක් පත් කිරීම ද අප බෙහෙවින් අගය කරමු. එහෙත් මේ වන විට පසුගිය මැතිවරණයේ යම් යම් අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් චෝදනා ලැබූ සහ විනය පරීක්ෂණවලට ලක්වූ රාජ්‍ය නිලධාරීන් සමහරක් මෙන්ම පසුගිය කාලසීමාව තුළ මහත් ආන්දෝලනයට නියමිත නිලධාරීන්ද, අමාත්‍යාංශ ලේකම් තනතුරු වැනි උසස් නිලයන් සඳහා යෝජනා වී ඇති බව වාර්තා වේ. අප ඔබ තුමාගෙන් ඉල්ලා සිටින්නේ සාම්ප්‍රදායික පක්ෂ දේශපාලන යාන්ත්‍රණයෙන් බැහැර පුද්ගලයෙකු ලෙස ඔබ තුමන් මේ දක්වා ගනු ලැබූ යහපත් තීරණ අනුව රට මෙහෙයවීමේ ප්‍රධාන භූමිකාවක් හොබවන අමාත්‍යාංශ ලේකම්වරුන් පත් කිරීමේදී දූෂණ චෝදනා එල්ල වූ හෝ, ජනාධිපතිවරණ කාලය තුළ මැතිවරණ නීති උල්ලංඝණය කළ හෝ රාජ්‍ය නිලධාරීන් පත් නොකිරීමට කටයුතු කරන ලෙසයි. එමෙන්ම ඔබ තුමන්ගේ ධූර කාලය තුළ ශ්‍රී ලංකාව ආසියාවේ ආර්ථික, සාමාජයීය, දේශපාලනික වශයෙන් ඉහළ තැනකට ඔසවා තබන්නට සමත්වනු ඇතැයි අප විශ්වාස කරන අතර ඒ සඳහා අවැසි දිරිය ශක්තිය ලැබේවායි වැඩි දුරටත් ප්‍රාර්ථනා කරමු.

ස්තුතියි.
මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,
විධායක අධ්‍යක්ෂ.

පිටපත - සභාපති තුමා, මැතිවරණ කොමිෂන් සභාව.
ලේකම් තුමා, ජනාධිපති ලේකම් කාර්යාලය.

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com